# රත්තොට කොට්ඨාශයේ කිතුල් පොකුරු ගම්මානයක් ඇති කිරීම.

## කලාප - 01







රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**01). ව්‍යාපෘතියේ නම :**

**රත්තොට කොට්ඨාශයේ කිතුල් පොකුරු ගම්මානයක් ඇති කිරීම. කලාප - 01**

**02). හැදින්වීම :**

රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්වභාවිකව වැඩුණු කිතුල් ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් කිතුල් මල් මැදීමට සුදුසු තත්වයේ පවතින අතර ඒ සඳහා මනා විභවයක්ද පවතී. කිතුල් කර්මාන්තය සඳහා මෙම කොට්ඨාශය තුල සෘජු හා වක්‍ර ලෙස නියැලෙන පුද්ගලයින් සංඛ්‍යාව මේ වන විට 300 කට වඩා වැඩි වන අතර ඒ සඳහා මනා ඉල්ලුමක්ද පවතී.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාමේදී වර්තමානයේදී ගැටළු රැසකට කිතුල් ආශ්‍රිත නිෂ්පාදන කරුවන් මුහුණ පා ඇත. නවීන තාක්ෂණික දැනුම නොමැතිකම, අවශ්‍ය උපකරණ හිගකම, වෙළඳපොල අවස්ථා නොමැතිකම, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙළඳ මධ්‍යස්ථාන නොමැතිකම, කිතුල් නිෂ්පාදන සඳහා නීතිමය ප්‍රශ්න ඇති වීම, කිතුල් කර්මාන්තයේ නියැලෙන පිරිස සඳහා නිසි සමාජ පිලිගැනීමක් නොතිබීම, ආදී ගැටළු රාශියකට කිතුල් කර්මාන්තකරුවන් මුහුණ පා ඇත.

**03). පිහිටීම :**

දිස්ත්‍රික්කය : මාතලේ

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : රත්තොට

ග්‍රාම නිළධාරි වසම/වසම් :

- මුවන්දෙනිය
- ගන්සරපොල
- පල්ලෙයාය
- වැටැස්යාය
- උඩගම
- නෙළුවාකන්ද

**04). ව්‍යාපෘති පසුබිම :**

රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඉහත සඳහන් වසම් 06 පුරා කිතුල් වගාව ව්‍යාප්තව පවතින අතර මිශ්‍ර වගාවන් යටතේ කිතුල් ගස් 5- 15 අතර ප්‍රමාණයෙන් දක්නට ලැබෙන අතර තනි වගාවන් ලෙස කිතුල් වගාවන් හමු නොවේ. කිතුල් මලක් වැටීමට කිතුල් පැලයක් වගා කොට අවුරුදු 4½ ක් 5 ක් අතර කාලයක් ගතවන අතර පළමු මල ඵලදායී මලක් නොවේ. දෙවන මලේ සිට මල් 10 ක් පමණ වැටෙන අතර මල් 4 ක් 5 ක් පමණ ඵලදායී මල් එනම්, තෙලිජ්ජ හෙවත් මී රා ලබා දෙන මල් වේ. මෙහිදී මල කපා බෙහෙත් තැබීමක් සිදුකරන අතර එය නිවැරදිව කලහොත්

හොඳ මී රා අස්වැන්නක් ලබා ගත හැක. නමුත් ඒ සඳහා පුහුණුව හා නිවැරදි තාක්ෂණය පිළිබඳ දැනුම අවශ්‍ය වේ. උදේ සවස මල මැදීම කරන අයෙකුට මී රා ලීටර් 8 ක් 10 ක් ලබා ගත හැකි අතර කිතුල් රා හෝ පැණි නිෂ්පාදනයෙන් රු.2000 ක පමණ සාමාන්‍ය දෛනික ආදායමක් උපයා ගත හැක. කිතුල් බහු වාර්ෂික බෝගයක් වන අතර ආදායමක් ලබා ගැනීම සඳහා වසර 5 ක කාලයක් ගතවීමත් මල් 05 කින් පසු ඵලදායීතාව අඩු වීමත් නිසා විවිධ වර්ධක අවස්ථාවල පසු වන කිතුල් වගාවක් සිදු කල යුතුය.

කිතුල් වගාව වර්තමානයේ එතරම් අවධානයට ලක් නොවූ වගාවක් වන නමුත් කිතුල් නිෂ්පාදන සඳහා ඉහල ඉල්ලුමක් පවතී. දැනට පවතින කිතුල් අස්වැන්නෙන් එම ඉල්ලීම සපුරාලිය නොහැක. එමනිසා කිතුල් වගාව ප්‍රචලිත කිරීම සඳහා ඉතා ඉහල විභවයක් පවතී. කිතුල් නිෂ්පාදන සඳහා දෙස් විදෙස් වෙළඳපොළ විවෘතව පවතින අතර අගය එකතු කල නිෂ්පාදන සඳහාද ඉතා ඉහල විභවයක් පවතී. උසස් ප්‍රමිතියෙන් යුක්ත කිතුල් පැණි බෝතලයක් සඳහා රු.650 - 750 ක් අතර මිලක් ලබා ගතහැකි අතර හකුරු කිලෝවක් රු.1000 කට අලෙවි කල හැක. එනම්, කිතුල් වගාව යනු ඉහල ආර්ථික වටිනාමක් සහිත වගාවකි.

**05). අරමුණු :**

1. රත්තොට කොට්ඨාශයේ කිතුල් වගාව ප්‍රවර්ධනය කිරීම තුලින් කිතුල් වගාකරුවන්ගේ ආර්ථිකය නංවාලීම.
2. කිතුල් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය.
3. පවතින කිතුල් වගාව ආර්ථික ඵලදායී මට්ටමට ප්‍රවර්ධනය කිරීම.
4. කිතුල් නිෂ්පාදන සඳහා නව තාක්ෂණය භාවිතය.

**06). අපේක්ෂිත නිෂ්පාදන :**

a). කිතුල් පැණි

- නව ඇසුරුම් ක්‍රම හඳුන්වා දීම.
- කල් තබා ගැනීමේ ක්‍රමවේද හඳුන්වා දීම.
- ගුණාත්මක බව ඉහල නැංවීම.
- සහන මිලට උපකරණ ලබා දීම.
- පුහුණුව ලබා දීම
- දේශීය විදේශීය වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීම.

b). කිතුල් හකුරු

- නව ඇසුරුම් ක්‍රම හඳුන්වා දීම.
- කල්තබා ගැනීමේ ක්‍රම හඳුන්වා දිම.
- ගුණාත්මක බව ඉහල නැංවීම.
- සහන මිලට උපකරණ ලබා දීම

- පුහුණුව ලබා දීම.
- දේශිය විදේශිය වෙළඳපොල අවස්ථා හඳුන්වා දීම

c). කිතුල් රා

- රිවස්ටන් සංචාරක කලාපය තුල රා අලෙවි සැලක් ස්ථාපිත කිරිම.
- සෙම්බුවත්ත සංචාරක කලාපය තුල රා අලෙවි සැලක් ස්ථාපිත කිරිම.
- නිසි ප්‍රමතියට රා නිෂ්පාදනය.
- කිතුල් මදින්නන් සඳහා පුහුණුව හා උපකරණ ලබා දීම.
- නිෂ්පාදන ඒකරාශි කිරීමේ පහසුකම් ඇති කිරිම.
- නීතිමය ගැටළු නිරාකරණය.
- කිතුල් ගොවි සංවිධාන ඇතිකර ලියාපදිංචි කිරිම.
- දේශීය විදේශීය වෙළඳපොළ අවස්ථා ඇතිකිරීම.

d). කිතුල් පිටි

- නව ඇසුරුම් ක්‍රම හඳුන්වා දීම.
- කල් තබා ගැනීමේ ක්‍රමවේද හඳුන්වා දීම.
- ගුණාත්මක බව ඉහල නැංවීම.
- සහන මිලට උපකරණ ලබා දීම.
- පුහුණුව ලබා දීම.
- දේශීය විදේශීය වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීම.

e).කිතුල් දැව ආශ්‍රිත නිෂ්පාදන

- විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය.
- විවිධ නිෂ්පාදන අවස්ථා හඳුන්වා දීම.
- කිතුල් දැව ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථාන දෙකක් ඇති කිරීම.
- පුහුණුව ලබා දිම.
- අවශ්‍ය උපකරණ හා ණය පහසුකම් ලබා දීම.
- දේශීය විදේශීය වෙළඳපොල අවස්ථා හඳුන්වා දීම.

**07). ව්‍යාපෘති සාධාරණීකරණය:**

කිතුල් නිෂ්පාදන අලෙවි කිරීම තුලින් දෛනික ආදායම රු.1500 ක් 2000ක් අතර ප්‍රමාණයක් එනම්, මාසික ආදායම දළ වශයෙන් රු.15,000 ක් රු.30,000 ක පමණ ආදායමක් උපයා ගත හැක. නමුත් කිතුල් ගසේ ස්වභාවය අනුව මෙය අඛණ්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය වන අතර ඒ සඳහා නව වගා ස්ථාපිත කිරීමත් පවතින වගා ප්‍රවර්ධනය කිරිමත් අපේක්ෂා කෙරේ. වර්ථමානයේ කිතුල් ගස් සඳහා කිසිදු කෘෂිකාර්මික කළමණාකරන ක්‍රමවේදයක් අනුගමනය නොකරන අතර කිතුල් වගාව සඳහා නිර්දේශිත යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (

Good Agriculture Practices ) අනුගමනය කිරීම තුළින් අපේක්ෂිත ඉහල අස්වනු කරා එලඹිය හැක. එලෙසම පවතින වගාව අතරතුර විවිධ වයස් කාණ්ඩ යටතේ අඛණ්ඩ වගාවක් ස්ථාපිත කිරීම තුලින් වසර පුරාම තිරසර අඛණ්ඩ ආදායමක් ලගා කරගත හැක. අනෙකුත් වගාවන් වලට සාපේක්ෂව කිතුල් වගාව සඳහා දැරීමට සිදු වන්නේ අඩු පිරිවැයකි. එමනිසා වැය කරන පිරිවැයට සාපේක්ෂව ඉහල ආදායමක් ලගාකරගත හැකි ව්‍යාපාරයක් ලෙස **කිතුල් වගාව** හැදින්විය හැක.

**08). ඍජු ප්‍රතිලාභීන් සංඛ්‍යාව :**

- සමෘද්ධිලාභීන් - කිතුල් වගාකරුවන් බොහෝමයක් අඩුආදායම්ලාභී සමෘද්ධි ප්‍රතිලාභීන් වේ.
- අඩු ආදායම් ලාභීන් - (සමෘද්ධි ලාභීන් නොවන)

පහත වගුවෙන් එක් එක් වසම් වලට අයත් ඍජු ප්‍රතිලාභීන් සංඛ්‍යාව දැක්වෙන අතර මෙම වගාව ආශ්‍රිතව වක්‍ර ප්‍රතිලාභීන් 300 ක් පමණ හදුනා ගත හැක.

**09). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ක්‍රමවේදය :**

I. නව වගා ස්ථාපිත කිරීම :

රත්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය කිතුල් වගාව සඳහා ඉතාම යෝග්‍ය පාරිසරික තත්වයක් පවතී. ඒ අනුව රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වසම් 54 තුලම කිතුල් වගාවට ඉතාම හිතකර පරිසරයක් පවතී. මේ යටතේ කිතුල් වගා කිරීමට ඉඩම් පවතින ප්‍රතිලාභීන් තෝරාගෙන ඔවුන්හට කිතුල් පැල ලබා දීමට බලාපොරොත්තු වේ.

II. පවතින වගා ප්‍රවර්ධනය :

වර්තමානයේ කිතුල් කර්මාන්තයේ නියැලෙන පිරිස කිතුල් වගාව නඩත්තු කිරීමක් සිදු නොකරයි. බොහෝ දුරට කිතුල් ශාකය ස්වභාවිකව හැදි මල් මදින තත්වයට පත්වේ. එනම් මෙම ශාකය ඉබේ හැදී වැඩේ. තවද තම උත්සාහයෙන් කිතුල් වගා කිරීමට උනන්දු නොවේ. මෙම තත්වය මත දැනට පවතින කිතුල් ගස් නිසි පරිදි නඩත්තු කරවීම හා වයස්ගතව පවතින කිතුල් ගස් නිසිකාලයේදී ඉවත් කර අලුත් පැල සිටුවීම මගින් උසස් ප්‍රතිඵලයක් ලබා ගැනිමට හැකි ලෙසද, ඒ සඳහා ප්‍රතිලාභීන්ට පුහුණුව ලබා දීම සිදු කරයි.

III. නිෂ්පාදන ප්‍රවර්ධනය හා අගය එකතුකල නිෂ්පාදන ප්‍රවර්ධනය :

පහත දක්වා ඇති පරිදි කිතුල් නිෂ්පාදන බෙදා වෙන් කර ඒවා ප්‍රවර්ධනය කිරීම සිදුකරයි.

IV. තාක්ෂණය හදුන්වා දීම හා පුහුණුව :

වර්තමානයේ කිතුල් නිෂ්පාදනකරුවන්  පාරම්පරික තාක්ෂණික ක්‍රම භාවිතා කරයි. එම තත්වය මත ඉහල ප්‍රතිලාභයක් ලබා ගැනීමට ඔවුනට නොහැකිවී ඇත. එම නිසා නව තාක්ෂණික දැනුම හා පුහුණුව ලබා දීමට කටයුතු කරනු ලැබේ.

V. අවශ්‍ය උපකරණ ලබා දීම :

බොහෝ කිතුල් නිෂ්පාදනකරුවන් අඩුආදායම් පිරිසක් වෙයි. ඔවුනට තම නිෂ්පාදන කරගෙන යාමට අවශ්‍ය උපකරණ ලබා ගැනීමට වත්කමක් නොමැත. එම නිසා ඉහල නිෂ්පාදනයක් වෙළඳපොලට නොලැබී යයි. මේ යටතේ අවශ්‍ය උපකරණ ලබා දී ඉහල නිෂ්පාදනයක් වෙළඳපොළට ලබා ගැනීමට මෙමගින් අපේක්ෂා කෙරේ.

VI. කිතුල් නිෂ්පාදන වෙළඳ මධ්‍යස්ථානයක් ඇති කිරීම

දැනට කිතුල් නිෂ්පාදන අලෙවි කරගැනීම සදහා අලෙවි මධ්‍යස්ථායන නොමැතිකම නිසා කිතුල් ගොවීන් විශාල දුෂ්කර තාවයට මුහුණ පා ඇත. එම නිසා නිෂ්පාදන අලෙවි කරගැනීමට නොහැකිවීම මත බොහෝ පිරිසක් මෙම ක්ෂේත්‍රයෙන් ඉවත්ව වෙනත් ක්ෂේත්‍රයන් සදහා යොමුවෙමින් පවතී. එම නිසා කිතුල් නිෂ්පාදන අලෙවි කරගැනීමට අලෙවි මධ්‍යස්ථානයක්  ඉදිකිරීමට තව තව නිෂ්පාදනකරුවන් මෙම ක්ෂේත්‍රයට යොමු කරගත හැකිව පවතී. ඒ අනුව මෙම වෙළඳ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට නියමිතව පවතින්නේ දේශීය විදේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් පැමිණෙන්නේ පහත සංචාරක කලාපය පදනම් කරගෙනය.

ඒ අනුව ,

**සෙම්බුවත්ත සංචාරක කලාපය ආශ්‍රිතව - හඟරන්කන්ද වසම**

**10). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආකාරය :**

| අනු අංකය | වසම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මුවන්දෙනිය | 12 |
| 02 | ගන්සරපොල | 11 |
| 03 | පල්ලෙයාය | 13 |
| 04 | වැටැස්යාය | 14 |
| 05 | උඩගම | 10 |
| 06 | නෙළුවාකන්ද | 13 |
| | **එකතුව** | **73** |

**11). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ :**

- සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 300 කට වඩා ලැබීම.
- රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජාව සවිබල ගැන්වීම.
- දේශීය විදේශිය විනිමය ගලා ඒම.
- අතිරේක ආදායම් අවස්ථා හිමි වීම.
- ප්‍රජාවගේ ජීවන තත්වය ඉහල යාම.
- ශ්‍රී ලංකාවට නව නිෂ්පාදන හදුන්වා දීමට හැකි වීම.

**12). ව්‍යාපෘතිය අධීක්ෂණය හා පසු විපරම :**

- රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- රාජ්‍ය වතු වැවිලි සමාගම
- ශ්‍රී ලංකා පොලීසිය
- රත්තොට ප්‍රාදේශීය සභාව
- ශ්‍රී ලංකා සුරාබදු අධිකාරි

**13). කාල රාමුව :**

| අනු. අංකය | ක්‍රියාවලිය | 2021 වර්ෂය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෙ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| 01 | නව වගා ස්ථාපිත කිරීම | | | | | | | | | | |
| 02 | පවත්නා වගා ප්‍රවර්ධනය කිරීම | | | | | | | | | | |
| 03 | උපකරණ ලබා දීම | | | | | | | | | | |
| 04 | නිෂ්පාදන ප්‍රවර්ධනය හා අගය එකතුකිරීම් නිෂ්පාදන ප්‍රවර්ධනය | | | | | | | | | | |
| 05 | තාක්ෂණය හදුන්වා දීම හා පුහුණුව ලබා දීම | | | | | | | | | | |
| 05 | වැඩ මඩු ඉදි කිරීම | | | | | | | | | | |
| 06 | කිතුල් නිෂ්පාදන වෙළඳ ම්‍යස්ථානය ඉදි කිරීම | | | | | | | | | | |

**14). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දළ වියදම් ඇස්තමේන්තුව :**

**<u>එක් ප්‍රතිලාභියකු සඳහා දළ වියදම් ඇස්තමේන්තුව</u>**

| අනු අංකය | ක්ෂේත්‍රය | දළ ඇස්තමේන්තුව |
|---|---|---|
| 01. | ➢ ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ප්‍රතිපාදන<br>වැඩ මඩු සෑදීම සඳහා අමුද්‍රව්‍ය<br>ඉන්ධන පිරිමැසුම්දායී ලිප් සඳහා<br>ආරක්ෂිත බඳ පටි සඳහා<br>පිහි 02 ක් සඳහා<br>වට්ටි සඳහා<br>තාච්චි/මූඩි සඳහා<br>ලේබල්/ බෝතල් සඳහා | <br><br>50,000.00<br>20,000.00<br>8,000.00<br>2,000.00<br>2,000.00<br>10,000.00<br>8,000.00 |
| | **එකතුව** | **100,000.00** |
| 02. | ප්‍රතිලාභියා විසින් දරන දායකත්වය<br>➢ ප්‍රතිලාභින් සතුව ඇති උපකරණ<br>➢ පවතින වගා නඩත්තුව , නව වගාව ස්ථාපිත කිරීම (පැල ලබා ගැනීම/බිම් සකස් කිරීම/වැඩ මඩුව සකස් කිරීම සඳහා ශ්‍රම දායකත්වය) | 40,000.00<br><br>60,000.00 |
| | **එකතුව** | **100,000.00** |

**<u>ව්‍යාපෘතිය සඳහා දළ වියදම් ඇස්තමේන්තුව</u>**

| අනු අංකය | ක්ෂේත්‍රය | දළ ඇස්තමේන්තුව |
|---|---|---|
| 01. | ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීන් සඳහා දරණ වියදම රු.100,000.00* 73 | රු. 7,300,000.00 |
| 02. | ප්‍රතිලාභියා විසින් දරණ වියදම රු.100,000* 73 | රු 7,300,000.00 |
| 03. | තාක්ෂණික දැනුම හා පුහුණු වැඩසටහන් /උපදෙස් සම්පත් දීමනාව/අමු ද්‍රව්‍ය/සංග්‍රහ වියදම් /ලිපිද්‍රව්‍ය | රු. 200,000.00 |
| 03. | කිතුල් නිෂ්පාදන වෙළඳ මධ්‍යස්ථානය ඉදි කිරීම | රු. 2,250,000.00 |
| | **ව්‍යාපෘතියේ මුළු වියදම** | **රු.17,050,000.00** |
| | **ප්‍රතිලාභී දායකත්වය** | **රු. 7,300,000.00** |
| | **ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිපාදන** | **රු. 9,750,000.00** |
| | **පරිපාලන වියදම් 2.5 %** | **රු. 250, 000.00** |
| | **ව්‍යාපෘතියේ අපේක්ෂිත මුළු ප්‍රතිපාදන** | **රු. 10,000,000.00** |

**15).** **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන පාර්ශවකරුවන්:**

| ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | තනතුර | දුරකථන අංකය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රත්තොට | සි.එල්.තිලකරත්න මිය (සහකාර අධ්‍යක්ෂ)<br>එල්.පි.නිලූකා පතිරණ මිය (විෂය භාර නිලධාරි) | 071-8064757<br>076-7520701 |
| විදාතා සම්පත් මධ්‍යස්ථානය | පි.ඩි.පි. ධනසේන මයා (විද්‍යා හා තාක්ෂණ නිලධාරි) | 0777-426786 |
| කාර්මික සංවර්ධන මණ්ඩලය - මාතලේ | ජේ.රෝහිත සුමනවීර මයා (සහකාර අධ්‍යක්ෂ) | 071-8321669 |
| පොල්, තල්, කිතුල් රාජ්‍ය අමාත්‍යාංශය | ඉදිරියේදී සම්බන්ධ කිරීමට නියමිතයි. | |

**16).** **ඉදිරිපත් කලේ :** රත්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලීය සැලසුම් අංශය **දිනය :**

**17).** **නිර්දේශය :** **දිනය :**

**18).** **අනුමැතිය :** **දිනය :**